තැපැල් පෙට්ටි සමාජය ඉදිරිපත් කිරීමක්...



# ගවේෂකයන්ගේ සමාජය

නම

______________________



ගවේෂණ 1

# පවුලේ ලැයිස්තුව

## පාඩම්


1 දෙවියන්වහන්සේ කෙබඳු කෙනෙක්ද? (පළමු කොටස)

2 දෙවියන්වහන්සේ කෙබඳු කෙනෙක්ද? (දෙවන කොටස)

3 අප කොහේ සිට පැමිණියේද?

4 අපගේ සතුරා කවුද?

5 පොරොන්දුවේ ගැළවුම්කරුවාණෝ කවුද?

6 අද යේසුස්වහන්සේ ජීවමානයි!

7 ප්‍රශ්න හතරක්

8 මට දෙවියන්වහන්සේගේ දරුවෙකු වීමට හැකිය!

9 යේසුස්වහන්සේ නැවත පැමිණෙන සේක!

10 දෙවියන්වහන්සේට අවශ්‍යව ඇති, මා විසින් දැන ගත යුතුව ඇති කාරණා හතරක්

11 ක්‍රිස්තුස්වහන්සේ තුළ වූ අලුත් පුද්ගලයා

12 දෙවියන්වහන්සේගේ උතුම්ම දීමනාව



ගවේශකයෝ 1 වැඩ පොත : ISBN 978-1-59480-593-6 www.mailboxclub.org

සටහන: සියලු තැපැල් පෙට්ටි සමාජ පාඩම් මාලාවන් සඳහා භාවිතා කර ඇත්තේ කිං ජේම්ස් පරිවර්තනයයි. පාඨකයාට පැහැදිලි අර්ථයක් ලබා ගැනීම උදෙසා මුල් පිටපත භාවිතා කර පරිවර්තනය කිරීමේ හිමිකම් අයිතිය අප සතු වේ.



සියලු හිමිකම් ඇවිරිණි.©2011 ගවේශකයෝ 1 තැපැල් පෙට්ටි සමාජ ජාත්‍යාන්තර රූප සටහන්, ස්ටීවන් බේට්ස් විසිනි.

# දෙවියන්වහන්සේ කෙබඳු කෙනෙක් ද?

## (පළමු කොටස)

**මේ පොත කුමක්ද?** එය බයිබලය වන අතර දේව වචනය ලෙසට ද දැක්වේ. දෙවියන්වහන්සේ සියල්ල මවන ලද බව බයිබලය අපට පවසයි. දෙවියන්වහන්සේ විසින් ඉර සහ සඳු මවන ලදී. අපට ඉහළින් වූ අහසේ දිදුළන තරු මිලියන ගණනක් ද උන්වහන්සේ මැවූ සේක. දෙවියන්වහන්සේ විසින් පෘථිවිය මවන ලදී. දෙවියන්වහන්සේ විසින් කුරුල්ලන්, මත්ස්‍යයන් සහ සතුන්ව ද, පළමු මිනිසාවත් ගැහැණියත් මැවූ සේක.

හිතවත් මිතුර,

දෙවියන්වහන්සේ කෙබඳු කෙනෙක්දැයි දැන ගැනීමට ඔබ අපහසුවෙන් සිටින්නේද? දෙවියන්වහන්සේ ඉතා පුදුමාකාර සහ ඉතා ශ්‍රේෂ්ඨ බැවින් අපට උන්වහන්සේ පිළිබඳව සියලු දේම දැන ගැනීමට නොහැක. නමුත් උන්වහන්සේ පිළිබඳව සියල්ල දැන ගැනීම පිණිස පුදුමය දනවන පොතක් අපට දී ඇත.



**දෙවියන්වහන්සේ විසින් අපව මවන ලද්දේ ඇයි?** අපව මවන ලද්දේ දෙවියන්වහන්සේට ප්‍රේම කරන පිණිස සහ උන්වහන්සේ විසින් අපට ප්‍රේම කරන පිණිසය. දෙවියන්වහන්සේ අප එකිනෙකාව දන්නා අතර එකිනෙකාට ද ප්‍රේම කරන සේක.

**එය දෙවියන්වහන්සේව ප්‍රසන්න කරවන්නේය.** උන්වහන්සේව දැන ගැනීමට සහ ප්‍රේම කිරීමට අපට අවශ්‍ය වූ විට දී, උන්වහන්සේට ඊට ප්‍රසන්න වන සේක. අප විසින් කළ හැකි යහපත්ම දෙය වනුයේ උන්වහන්සේව දැන ගැනීම සහ ප්‍රේම කිරීමයි. එය අපව ද සතුටට පත් කරවන්නේය.

**මෙම පාඩමෙන්** දෙවියන්වහන්සේ පිළිබඳව බයිබලය පවසන්නේ කුමක්දැයි අප දකින්නෙමු. එසේම, අපට බොහෝ සෙයින් ප්‍රේම කරන, අපගේ පුදුමාකාර වූ දෙවියන්වහන්සේ පිළිබඳ වැදගත් කාරණාවන් පහක් මෙහි දී අප ඉගෙන ගන්නෙමුව.

## දෙවියන් වහන්සේ පුද්ගලයෙකි

**ඇත්තේ එකම දෙවි කෙනෙකි** - එනම්, සත්‍ය වූ සහ ජීවමාන දෙවියන්වහන්සේය. උන්වහන්සේ මෙසේ පවසා ඇත. ''මම ස්වාමීන්වහන්සේය, වෙන කෙනෙක් නැත; මා ඇර වෙන දෙවි කෙනෙකු නැත'' (යෙසායා 45:5).

දෙවියන්වහන්සේ යම්කිසි ''බලයක්'' නොවේ, දෙවියන්වහන්සේ අප සියලු දෙනාටම දන්නා වූ සහ ප්‍රේම කරන්නා වූ පුද්ගලත්වයක් ඇති දෙවියන්වහන්සේය. අප උන්වහන්සේව දැන ගන්නට කැමැති වන්නේ ද, එයට උන්වහන්සේ බෙහෙවින් ප්‍රසන්නය. මේ සියල්ලටම වඩා උන්වහන්සේට අවශ්‍ය වනුයේ අපගේ මුළු හදවතින්ම උන්වහන්සේට ප්‍රේම කිරීමයි.

## දෙවියන් වහන්සේ ආත්මයකි

**උන්වහන්සේ පුද්ගලත්වයේ දෙවියන්වහන්සේ වුවත්,** අප මෙන් උන්වහන්සේට ශරීරයක් නොමැත. උන්වහන්සේ ආත්මයක් වන සේක. දෙවියන්වහන්සේ විසින් අපව නිර්මාණය කිරීමේ දී, උන්වහන්සේ අපට ශරීරයක් දුන් සේක. ඒ සමගම ආත්මයක් ද අපට දුන් සේක. දැන් ඒ ආත්මය අප ශරීරය තුළ ජීවත් වන්නේය. අන් අයට ඔබගේ ශරීරය දැක ගත හැකි වුවත්, ආත්මය දැක ගැනීමට ඔවුන්ට නොහැක.

**දෙවියන්වහන්සේ සම්පූර්ණ ආත්මයකි.** අපට උන්වහන්සේව දැක ගත නොහැක්කේ මේ නිසාය. උන්වහන්සේව නියෝජනය වන පිණිස කිසි රූපයක් සාදා නොගන්නැයි උන්වහන්සේ අපට පවසන සේක. දෙවියන්වහන්සේ අපට කිසි ආකාරයක රූපයක් නමස්කාර නොකරන්නැයි පවසන සේක. බයිබලයේ මෙසේ පවසයි.''දෙවියන්වහන්සේ ආත්මයක් වන සේක. උන්වහන්සේට නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන් ද සැබෑකමෙන් ද නමස්කාර කළ යුතු යයි කී සේක'' (ශු:යොහන් 4:24).

**උන්වහන්සේව අපට නොපෙනුනත්,** උන්වහන්සේ එකම සත්‍යතාවයේ සහ ජීවමාන වූ දෙවියන්වහන්සේය. දෙවියන්වහන්සේට අවශ්‍යව ඇත්තේ, අප විසින් උන්වහන්සේව දැන ගැනීමයි. අප විසින් උන්වහන්සේව දැන ගන්නා විට, අප උන්වහන්සේට ප්‍රේම කරන්නෙමුව. අප එලෙස ප්‍රේම කරන විට, උන්වහන්සේට කීකරුවීම අප විසින් කළ යුතු වේ.

## දෙවියන් වහන්සේ මහිමාන්විතයි

**දෙවියන්වහන්සේ බෙහෙවින්ම දිදුලන බැවින්** අපට උන්වහන්සේව දැකිය නොහැක. හිරු මහත් ආලෝකයෙන් බබළන විට දී, ඒ දෙස බැලීමට අපට පුළුවන්කමක් නැත. එය අපගේ ඇස්වලට මහත් වේදනාවක් ගෙනෙන්නේය. අප හිරු දෙස බොහෝ වේලාවක් බලා සිටියහොත්, අපට අපගේ ඇසේ පෙනීම නැති වන්නේය.

**දෙවියන්වහන්සේගේ මහිමය මේ හිරු රශ්මියට වඩා බෙහෙවින්ම වැඩිය.** අපට උන්වහන්සේ දෙස බැලිය නොහැක්කේ මේ නිසයි. දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක. ''...මාගේ මුහුණ දකින්ට නුඹට නුපුළුවන. මක්නිසාද මනුෂ්‍යයා මා දැක ජීවත් නොවන්නේය...'' (නික්මයාම 33:20).

**මෝසෙස් නම් මනුෂ්‍යයෙක් පිළිබඳව බයිබලය අපට පවසයි.** මෝසෙස් දෙවියන්වහන්සේගේ විශේෂිත මිත්‍රයෙකි. අවස්ථා කිහිපයකදීම, මෝසෙස් දෙවියන්වහන්සේ සමග කථා කළ අතර උන්වහන්සේ ද මෝසෙස් සමග කථා කළ සේක. නමුත් මෝසෙස් දෙවියන්වහන්සේව කෙදිනකවත් නුදුටුවේය.



දිනක්, මෝසෙස් දෙවියන්වහන්සේගේන් විශේෂ වරප්‍රසාදයක් ඉල්ලා සිටියේය. එනම්, ''...අනේ ඔබගේ තේජස මට පෙන්නුව මැනවයි''යනුවෙනි. (නික්මයාම 33:18).

දෙවියන්වහන්සේ මෝසෙස්ට මෙසේ පැවසූ සේක,''...මාගේ මුහුණ දකින්ට නුඹට නුපුළුවන. මක්නිසාද මනුෂ්‍යයා මා දැක ජීවත් නොවන්නේය...'', ''...නුඹ පර්වතය පිට සිටින්න. එවිට මාගේ තේජස නුඹ පසු කර යන කල...''

**මෝසෙස් තනියම කන්දේ ඉහළට නැග්ගේය.** පර්වතය අතර උන්වහන්සේ විසින් මෝසෙස්ව සැඟ වූ සේක. ඉන්පසු, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ මහිමය ඔහු අසලින් යන්නට සැලැස් වූ සේක. මෝසෙස් දෙවියන්වහන්සේව දුටුවේ නැත. නමුත් ඔහු දෙවියන්වහන්සේගේ මහිමයෙන් බිඳක් දුටුවේය. මෙයින් පමණක්ම මෝසෙස්ගේ මුහුණ දැඩිව බබළන්නට විය.

**මෝසෙස් කන්දේ පාමුලට බසිනා විට,** ඔහුගේ මුහුණ බබළමින් තිබුණේය. ජනතාව බියට පත් විය. මෝසෙස් සහ ඔහුගේ සෙනඟ මෙසේ පැවසීම පුදුමය දනවන්නක් නොවේය. එනම්, ''ස්වාමීන්වහන්ස, ...ඔබට සමාන කවුද? ශුද්ධකමින් මහිමවත් වූ,...''(නික්මයාම 15:11)

# දෙවියන් වහන්සේ අති ශුද්ධයි

**මෙයින් අර්ථවත් කෙරෙනුයේ, දෙවියන්වහන්සේ පවිත්‍ර සහ සම්පූර්ණ වූ දෙවිඳුන් බවයි.** පාපයෙන් ද තොරයි. බයිබලය අන්ධකාරය පාපය ලෙසට හඳුන්වා දී ඇත. බයිබලය දෙවියන්වහන්සේ පිළිබඳව මෙසේ පවසයි. ''...දෙවියන්වහන්සේ ආලෝකය බවත් උන්වහන්සේ තුළ කිසිම අන්ධකාරයක් නැති බවත්ය'' (1 යොහන් 1:5).

**දෙවියන්වහන්සේ ආලෝකය හා මහිමය වන සේක.** දෙවියන්වහන්සේ පවිත්‍ර වන සේක. දෙවියන්වහන්සේ කිසිවිටක පාපයක් නොකරන සේක. දෙවියන්වහන්සේ සැමවිටම යහපත් සහ නිවැරදි දේ කරන සේක. දෙවියන්වහන්සේගේ අභිමුඛයේ පාපයෙන් පිරි කිසිවක් නොවන්නේය. බයිබලය මෙසේ පවසයි. ''...අපේ දෙවි වූ ස්වාමීන්වහන්සේ ශුද්ධ සේක'' (ගීතාවලිය 99:9).

යෙසායා නම්, **දිවැසිවරයාට වරක් දෙවියන්වහන්සේ දර්ශනයකින් කථා කළ සේක.** දර්ශනයක් යනු සිහිනයක් වැනි දෙයකි. ඔහු දෙවියන්වහන්සේව සිංහාසනයේ වැඩ සිටින ආකාරය දුටුවේය. උන්වහන්සේගේ සිංහාසනය වටකර බොහෝ දේව දූතයන් සිටි අතර ඔවුන් දෙවියන්වහන්සේට ප්‍රශාංසා කරමින් මෙසේ පැවසුවෝය.''...සේනාවල ස්වාමීන්වහන්සේ ශුද්ධය, ශුද්ධය, ශුද්ධය, මුළු පොළොව උන්වහන්සේගේ තේජසින් පිරී තිබේ...'' (යෙසායා 6:3).

**යෙසායා විසින් දෙවියන්වහන්සේගේ මේ දර්ශනය දුටු විට,** ඔහු බියට පත් විය. මේ දර්ශනය ඔහු පව්කාරයෙකු බව ඇඟ වූ අතර දෙවියන්වහන්සේ ශුද්ධ බව පෙන්විය.



# දෙවියන් වහන්සේ ප්‍රේමයයි



## දෙවියන් වහන්සේ ප්‍රේමයයි

**මෙයින් අර්ථවත් කරනුයේ,** දෙවියන්වහන්සේ අපට **ප්‍රේම කරන** බව හා උන්වහන්සේට අවශ්‍ය වනුයේ සියලු යහපත අපට දීමටයි.

දෙවියන්වහන්සේ අපට ප්‍රේම කරන බව අප දැන ගන්නේ කෙසේද? අප දන්නා මාර්ගයන් දෙකක් ඇතඃ

- **දෙවියන්වහන්සේ එය පවසා තිබෙන සේක.** දේව වචනයේ, දෙවියන්වහන්සේ මෙසේ පවසන සේක, ''...සදාකාල ප්‍රේමයකින් නුඹට ප්‍රේම කෙළෙමි...'' (යෙරෙමියා 31:3).
- **දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයාව** දෙනු ලැබුවේ, අපගේ පාපයේ දඬුවම උන්වහන්සේගේ කරපිටට ගැනීම උදෙසාය.

**දෙවියන්වහන්සේ උන්වහන්සේගේ මහත් ප්‍රේමය අපට පෙන්වනු ලැබුවේ,** උන්වහන්සේගේ පුත්‍රයාණන්ව අප වෙනුවෙන් දීමෙනි. අප විසින් කරන ලද සහ පවසන ලද සියල්ල වෙනුවෙන් ස්වාමි වූ යේසුස්වහන්සේ අපගේ පාපය - වෙනුවෙන් කුරුසියේ දී මරණයට පත් වූ සේක. බයිබලය මෙසේ පවසයි, ''නුමුත් දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ මරණය විඳීමෙන්ය'' (රෝම 5:8).

**ඔබ මෙසේ සිතනවා ඇත,** ''මා විසින් කරන ලද සහ පවසන ලද සියල්ල උන්වහන්සේ දන්නේද?'' ඔව්, දෙවියන්වහන්සේ ඒ සියල්ලම දන්නා සේක, නමුත් තවමත් උන්වහන්සේ ඔබට මුළු හදවතින්ම ප්‍රේම කරන සේක.

ඔබගේ ජීවිතයේ සෑම විනාඩියක්ම පාසා උන්වහන්සේ ඔබට ප්‍රේම කරන සේක.

**ස්වාමි වූ යේසුස්වහන්සේ මාගේ පාපය උදෙසා මිය ගිය සේක.** උන්වහන්සේ ඔබගේ පාපය උදෙසා මිය ගිය සේක. නමුත් උන්වහන්සේ එසේ මරණයට පත් වී සිටියේ නැත. උන්වහන්සේ තුන් වැනිදා මළවුන්ගෙන් උත්ථාන වූ සේක. උන්වහන්සේ අපගේ ජීවමාන ගැළවුම්කරුවාණෝය; ඔබගේ පාපය වෙනුවට උන්වහන්සේ **මිය ගිය** බවත් සහ ඔබගේ ගැළවුම්කරුවාණන් ලෙසට මරණින් උත්ථාන වූ බවත් ඔබ විසින් විශ්වාස කිරීම, දෙවියන්වහන්සේගේ අවශ්‍යතාවයයි.

**දෙවියන්වහන්සේ ඔබගෙන් වැඩියෙන්ම ඉල්ලා සිටින්නේ කුමක්දැයි ඔබ දන්නෙහිද?** දෙවියන්වහන්සේට අවශ්‍ය අප අපගේ මුළු හදවතින්ම උන්වහන්සේට ප්‍රේම කිරීමයි!

අපි, අපගේ මුළු හදවතින්ම උන්වහන්සේට ප්‍රේම කිරීම තෝරා ගත් විට **එය දෙවියන්වහන්සේට ප්‍රසන්න වන සේක.** බයිබලයේ සඳහන් දාවිත් රජතුමා දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙකි. ඔහු දෙවියන්වහන්සේට ප්‍රේම කිරීමට තෝරා ගත්තේය. ඔහු මෙසේ පවසා ඇත, ''අහෝ ස්වාමිනි, මම ඔබට ප්‍රේම කරමි.'' මෙය දෙවියන්වහන්සේට ප්‍රසන්න වූ සේක. දාවිත් රජු මෙන් ඔබත් දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නට තෝරා ගන්නේ නම්, දෙවියන්වහන්සේ ඊට බෙහෙවින්ම ප්‍රසන්න වන සේක. පහතින් දැක්වෙන කෙටි යාච්ඤාව ඔබට මේ සඳහා උපකාර වේඃ

**''දයාබර දෙවියන්වහන්ස, අප විසින් ඔබට ප්‍රේම කරනු ලැබීම ඔබගේ අවශ්‍යතාවය බව දැන් මා දන්නා බැවින් මම සතුටු වෙමි. මාගේ මුළු හදවතින්ම ඔබට ප්‍රේම කිරීමට ඉමහත් උවමනාවක් මට ඇත. ඔබ මා වෙනුවෙන් දැක් වූ ආදරය උදෙසා ඔබගේ පුත්‍ර වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව මාගේ පව් උදෙසා කුරුසියේ මිය යන පිණිස, මෙලොවට එවූ නිසා ස්තුති කරමි.''**




# මම, දෙවියන්වහන්සේගේ දරුවෙකු වන්නේ කෙසේද?


අ - ඔබ පව්කරුවෙකු බවට පිළිගන්න.

ආ - ඔබගේ පාප උදෙසා යේසුස්වහන්සේ මිය ගිය බව විශ්වාස කරන්න.

ඇ - ස්වාමි වූ යේසුස්වහන්සේ වෙතට පැමිණ උන්වහන්සේ ඔබගේ ගැළවුම්කරුවාණන් ලෙසට පිළිගන්න.

‘‘ස්වාමි වූ යේසුස්වහන්ස, මම මාගේ පව් උදෙසා ඇත්තෙන්ම කමාව යදිමි. ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බවට විශ්වාස කරන අතර, මාගේ පාප උදෙසා මිය ගිය බවත් විශ්වාස කරමි. මාගේ යහපත් දැන ගැනීමට අනුව දැන් මම උන්වහන්සේව මාගේ ගැළවුම්කරුවාණන් ලෙසට පිළිගනිමි.’’

# මාගේ කට පාඩම් පදය




# නිධන් සෙවීම

**පහතින් දක්වා ඇති නිධන් සෙවීමේ ප්‍රහේලිකාව විසඳීමේ රහස් සංකේත ක්‍රමය භාවිතා කරන්න.**

## රහස් සංකේත ක්‍රමය

ක මු හ ඵ න් ති ව සේ වි

ද න ර ට ප්‍රේ ය ම දෙ



මු



# ප්‍රශ්න පිටුව

## ගවේශකයෝ 1 පාඩම 1

**උපදෙස් : වඩා නිවැරදි පිළිතුර තෝරන්න - අ හෝ ආ, සපයා ඇති කොටුවේ ලියන්න.**

**නිදර්ශනය: ස්වර්ගය වනුයේ,**

[ ආ ]

(1) **දෙවියන්වහන්සේ කෙබඳු කෙනෙක්ද?**

[ ]
අ. දෙවියන්වහන්සේ විශ්වාසයේ යහපත සඳහා වූ ''බලයයි''.
ආ. අපව දන්නා වූ සහ අපට ප්‍රේම කරන්නා වූ පුද්ගලත්වයේ දෙවියන්වහන්සේය.

**(2) අපට දෙවියන්වහන්සේව දැක ගත නොහැක්කේ,**

[ ]
අ. දෙවියන්වහන්සේ ආත්මයක් වන අතර මනුෂ්‍යයාට ආත්මයක් දැක ගත නොහැකි නිසාය.
ආ. දෙවියන්වහන්සේ අපට බොහෝ සෙයින් ඈතින් සිටින බැවින් අපට දැක ගත නොහැකි නිසාය.

**(3) බයිබලයේ දෙවියන්වහන්සේ ශුද්ධ බව පවසන අතර, එයින් අර්ථවත් කරනුයේ,**

[ ]
අ. දෙවියන්වහන්සේ බොහෝ යහපත් වන බවයි.
ආ. දෙවියන්වහන්සේ පවිත්‍ර, සම්පූර්ණ සහ කුමන ආකාර පාපයකින් හෝ තොර වීමය.

**(4) දෙවියන්වහන්සේ මට ප්‍රේම කරන බව මම දනිමි. මක්නිසාද,**

[ ]
අ. මගේ පාප උදෙසා මිය යන පිණිස උන්වහන්සේ තමන්වහන්සේගේ පුත්‍රයාණන් දුන් සේක.
ආ. උන්වහන්සේ එසේ කරයි යැයි මට හැඟෙන බැවිනි.

**(5) මේ සඳහා මා විසින් බෙහෙවින්ම කළ යුත්තේ කුමක්ද ?**

[ ]
අ. මා විසින් මාගේ මුළු හදවතින්ම උන්වහන්සේට අවශ්‍යව ඇත.
ආ. උන්වහන්සේ වෙනුවෙන් බොහෝ යහපත් දේ මා විසින් කිරීම උන්වහන්සේට අවශ්‍යව ඇත.

---

මෙම පාඩමේ කට
පාඩම් පදය මෙහි ලියන්න.



නිධන් සෙවීමේ ප්‍රහේලිකාවෙන්
සොයා ගත් පිළිතුර මෙහි ලියන්න.

නම : ______________________ උපන් දිනය: ____/____/____ වයස ______ පංතිය ______
(කරුණා කර මුද්‍රණය කරන්න.) (වර්ෂය මාසය දිනය) (වැඩිහිටියෙක් නම් අත් හරින්න.)

දෙමාපියන් /භාරකරු : ______________________
(වැඩිහිටියෙක් නම් අත් හරින්න.)

# යේසුස්වහන්සේ සමග මගේ ගමන

1 මෙම පාඩමෙන් ඔබ විසින් ඉගෙන ගන්නා ලද ඉතා වැදගත් දේ කුමක්ද?

2 මෙම පාඩමෙන්  ඔබ තේරුම් නොගත් දේ ඇත්තේද?

3 ඔබට විශේෂ අවශ්‍යතාවයක් හෝ යාච්ඤා ඉල්ලීමක් ඇත්ද?

4 සඟරාවක් ආරම්භ කිරීමට අපි ඔබව දිරිමත් කරමු. දෙවියන් වහන්සේට ඔබගේ යාච්ඤා, ප්‍රශංසා සහ ස්තුතිය ලියන්න!

the Mailbox Club
තැපැල් පෙට්ටි සමාජය